# අත්‍යවශ්‍ය සේවා කොමසාරිස් ජනරාල් කාර්යාලය

## அத்தியாவசிய சேவைகள் ஆணையாளர் நாயகம் அலுவலகம்

## OFFICE OF THE COMMISSIONER GENERAL OF ESSENTIAL SERVICES


2025 දෙසැම්බර් 09 ප.ව. 9.30
ගොනු අංකය : 2025/08

# මාධ්‍ය නිවේදනය

මේ වනතෙක් බලපෑමට ලක්වූ බවට හඳුනාගත් මාර්ග කොටස් 298න්, 288ක්ම ගමනාගමන කටයුතු සඳහා විවෘත කර ඇත. එසේම බලපෑමට ලක් වූ මාර්ග, පාලම්, බෝක්කු, වැව්අමුණු හා ගොඩනැඟිලි ප්‍රතිසංස්කරණ කටයුතු කඩිනමින් සිදු කිරීම සඳහා සියලු පළාත් සභා, අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා පළාත් පාලන ආයතනවලට අදාළව 2025.12.01 සිට 2026.03.31 දින දක්වා ප්‍රජා පදනම් සංවිධාන වෙත වැඩ කොන්ත්‍රාත් පැවරීමේ මූල්‍ය සීමාව රුපියල් රු. මිලියන 2 සිට මිලියන 5 දක්වා වැඩි කිරීමට ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව වෙත දැනුම් දී ඇත.

බිඳවැටුණු ප්‍රජා ජල සැපයුම් පද්ධති යළි යථා තත්ත්වයට පත් කිරීම සඳහා අවශ්‍ය රොන්මඩ ඉවත් කිරීමේ පොම්පවල (Sludge Pumps) හිඟයක් පවතින බැවින් හදිසි ප්‍රසම්පාදන ක්‍රියාවලිය යටතේ රොන්මඩ ඉවත් කිරීමේ පොම්ප මිලදී ගැනීමට ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව වෙත අනුමැතිය ලබා දී ඇත. 2025 වර්ෂය තුළ දී ප්‍රතිසංස්කරණය කිරීමට නොහැකි බව හඳුනාගත් බිඳ වැටුණු පානීය ජල සැපයුම් ව්‍යාපෘති ස්ථිර ලෙස ප්‍රතිසංස්කරණය කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන 2026 වර්ෂයේ දී අදාළ පළාත් ප්‍රධාන ලේකම්වරුන් වෙත ලබා දීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස මුදල් කොමිෂන් සභාව වෙත නිර්දේශ ලබා දී ඇත. මධ්‍යම පළාත තුළ අඛණ්ඩ ජල සැපයුමක් පවත්වා ගැනීම සඳහා ප්‍රමාණවත් ට්‍රැක්ටර් හා ජල බවුසර නොමැති බැවින් ශ්‍රී ලංකා යුද හමුදාව සතු බවුසර යෙදවීමට කටයුතු කරන ලද අතර අනෙකුත් පළාත් සභා දැනුවත් කර එම පළාත් සභා සතු ජලය ප්‍රවාහනය කිරීමට භාවිත කළ හැකි ට්‍රැක්ටර් බවුසර මධ්‍යම පළාත වෙත ලබා දීමට අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු කඩිනමින් සිදු කරන ලෙස රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් දැනුවත් කර ඇත. එසේම, හදිසි ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුගමනය කරමින් පෞද්ගලික අංශයෙන් ට්‍රැක්ටර් හා ජල බවුසර කුලී පදනම මත ලබාගෙන මධ්‍යම පළාත තුළ 100%ක අඛණ්ඩ ජල සැපයුමක් පවත්වා ගෙන යාමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස ද අදාළ බලධාරීන් වෙත අවශ්‍ය උපදෙස් හා අනුමැතිය ලබා දී ඇත.

පශ්චාත්-ආපදා ඇගයීම් සඳහා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනෙහි (UNDP) සහයෙන් ක්‍රියාත්මක ප්‍රතිසාධන තක්සේරු මෙවලම (RAPIDA) කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් UNDP නේවාසික නියෝජිත 'අසූසා කුබෝටා' මහත්මිය සමඟ සාකච්ඡා කරන ලදි. පශ්චාත් ආපදා සේවා යථා තත්ත්වයට පත් කිරීම සඳහා සහාය වීමට උපකරණ, යන්ත්‍රෝපකරණ සහ මානව සම්පත් සැපයීම සම්බන්ධයෙන්


විද්‍යුත් තැපැල / மின்னஞ்சல்/ Email Address: cg@ocges.gov.lk ; info@ocges.gov.lk

තුන්වන මහළ, ලෝටස් ගොඩනැගිල්ල, අරලිය ගහ මන්දිරය, 150, ආර්. ඒ. ඩී. මැල් මාවත,කොළඹ 03
மூன்றாவது தளம், லோட்டஸ் கட்டிடம், டெம்பிள் ட்ரீஸ், 150, ஆர்.எ.ஏ. டி மெல் மவாதா,கொழும்பு 03
3rd Floor, Lotus Building, Temple Trees, 150,R.A. De Mel Mawatha, Colombo 03

‘UNOPS ශ්‍රී ලංකා’ කණ්ඩායම සම්බන්ධ කරන ලදි. ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව වෙත පශ්චාත්-ආපදා අවශ්‍යතා තක්සේරුව (PDNA) කඩිනමින් ආරම්භ කරන ලෙස දැනුම් දී ඇත. ඒ සඳහා අවශ්‍ය දත්ත සහ තොරතුරු ලබා දෙන ලෙස අමාත්‍යාංශ, පළාත් බලධාරීන්, ආයතන වෙත දැනුවත් කර ඇත. එමෙන්ම මේ යටතේ මහනුවර දිස්ත්‍රික්කයේ අවතැන්වූවන් හඳුනාගැනීමේ අනුකෘතිය (Displacement Tracking Matrix) සකස් කිරීම සඳහා ජාත්‍යන්තර සංක්‍රමණ සංවිධානයේ (IOM) කාර්යාලයක් මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ස්ථාපනය කිරීමට අවශ්‍ය කටයුතු සලසා ඇත.

ජාතික ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සතු ගබඩා පහසුකම් ප්‍රමාණවත් නොවන බැවින් දේශීය හා විදේශීය ආධාරකරුවන් වෙතින් ලැබෙන පරිත්‍යාග නිසි පරිදි බෙදාහරින තෙක් තාවකාලිකව ගබඩා කිරීම සඳහා ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව සතු ඔරුගොඩවත්ත ගබඩා සංකීර්ණය තාවකාලිකව ලබා දී ඇත. එමෙන්ම එම මධ්‍යස්ථානයේ කටයුතු ක්‍රමවත්ව පවත්වාගෙන යාම සඳහා අත්‍යාවශ්‍ය කාර්යාලීය උපකරණ කුලී පදනම යටතේ අවශ්‍ය හදිසි ප්‍රසම්පාදන ක්‍රියාවලිය මඟින් ලබා ගැනීම සඳහා අනුමැතිය ලබා දී ඇත. ඊට අමතරව, මත්තල ජාත්‍යන්තර ගුවන්තොටුපළ වෙත ලැබෙන විදේශීය ආධාර නිසි පරිදි බෙදා හරින තෙක් තාවකාලිකව ගබඩා කිරීම සඳහා, මත්තල ගුවන් භාණ්ඩ (Air Cargo) ගබඩා සංකීර්ණය තාවකාලිකව ආරක්ෂක අමාත්‍යාංශයට පැවරීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත දැනුම් දී ඇත.

අත්‍යාවශ්‍ය සේවා දුරකථන අංක 1904 ඔස්සේ 2025 දෙසැම්බර් 9 දින මධ්‍යහන 12.00 වන විට ඇමතුම් 1340ක් ලැබී ඇති අතර ප්‍රමුඛත්වය අනුව එම ගැටළු අදාල අංශ වෙත යොමු කර විසඳුම් ලබා දීමට කටයුතු කරමින් පවතී. එසේම රටපුරා සන්නිවේදන පද්ධතියෙන් 99%ක් මේ වන විට යථාතත්ත්වයට පත් කර ඇත.

බී.කේ.ප්‍රභාත් චන්ද්‍රකීර්ති
අත්‍යාවශ්‍ය සේවා කොමසාරිස් ජනරාල්